**මහර ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 2022 වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතියේ පරිච්ඡේද 3.28 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සේවකයින්ගෙන් ලැබිය යුතු දෑ රු.27,680 ක් අඩුවෙන් එකතුකිරීම, තොග රු.880,740 ක් වැඩියෙන් අඩුකිරීම, හුවමාරු ගනුදෙනුවලින් ලැබිය යුතු දෑ රු.117,706 ක් එකතු නොකිරීම සිදුව තිබුණි. | සංශෝධිත අවසන් ගිණුමෙන් නිවැරදි කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහය පිළියෙල කිරීමේදී වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.35,938,557 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | එම | එම |

### 1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව වෙත ලද පොදු කටයුතු ඉඩම් 02 ක වටිනාකම රු.600,000 ක් ඉඩම් හා පරිත්‍යාග ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | 2024 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශේෂ පිරික්සුම අනුව අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.22,621 ක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2024 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | එම |

### 1.6.3. නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 11 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ එකතුව රු.944,323,032 ක් වුවද උපලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.640,214,469 ක් වූයෙන් රු.304,108,563 ක වෙනසක් නිරීක්ෂණය විය. | සංශෝධිත උපලේඛනය අවසන් ගිණුම සමග ඉදිරිපත් කරන බව. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ) | දේපල පිරියත හා උපකරණ ශුද්ධ වටිනාකම සටහන් අංක 16 අනුව රු.1,075,673,962 ක් සහ වත්කම් වගකීම් ප්‍රකාශය අනුව රු.1,075,005,310 ක් වූයෙන් රු.668,652 ක වෙනසක් නිරීක්ෂණය විය. | උපලේඛන අවසන් ගිණුම සමග ඉදිරිපත් කරන බව. | එම. |
| (ඇ) | තැන්පත් වටිනාකම ශේෂ පිරික්සුම අනුව රු.55,603,221 ක් සහ වත්කම් වගකීම් ප්‍රකාශනය අනුව රු.55,769,875 ක් වූයෙන් රු.166,654 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම | එම |
| (ඈ) | ශුද්ධ වත්කම් වටිනාකම, මුළු වත්කම්වලින් මුළු වගකීම් අඩු කළ විට රු.1,152,123,799 ක්ද, සමුච්චිත අතිරික්තය, සංචිත හා වෙන් කිරීම් සහ ප්‍රදාන වල වටිනාකම රු.1,152,267,634 ක්ද, වූයෙන් රු.143,835 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම | එම |

### 1.6.4. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| කෙරීගෙන යන වැඩ | 104,006,357 | ලේඛන | ඉදිරියේදී නිවැරදි කරන බව. | සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති | | | |
| | (i) අංක 8 | මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළයුතු වුවත්, 2024 මැයි 21 දින ඉදිරිපත් කරන ලදී. | සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2024 මැයි 21 දින ඉදිරිපත් කර ඇති බව | රීතී අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) අංක 90 | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු බව දක්වා ඇතත්, උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් පදනම මත ගිණුම් තබා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | එම |
| | (iii) අංක 83(ii) | සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදි පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | එම |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 2 ඉක්මවූ තැන්පතු වටිනාකම රු.1,056,630 ක් නියාදනය කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදු කරන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.98,414,694 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.77,588,762 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 87,729,240 | 83,279,471 | 56,865,314 | 130,966,854 | 82,957,140 | 84,062,374 | 41,841,917 | 106,046,680 |
| (ii) | කුලී | 5,112,000 | 4,320,386 | 4,265,939 | 183,265 | 4,289,700 | 4,266,074 | 3,985,605 | 128,818 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,230,000 | 1,633,493 | 1,633,493 | | 2,225,000 | 1,516,884 | 1,516,884 | |
| (iv) | වෙනත් ආදායම් | 27,549,000 | | 32,671763 | | 29,394,100 | | 26,575,313 | |
| | එකතුව | 122,620,240 | 89,233,350 | 95,436,509 | 131,150,119 | 118,865,940 | 89,845,332 | 73,919,719 | 106,175,498 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.103,578,993ක් වූ හිඟ වරිපනම් ශේෂයෙන් අයවීම් රු.25,143,780 ක් වූයෙන් අයවීම් ප්‍රතිශතය සියයට 24 ක් වී තිබුණු අතර, මේ තුල වසර 10 ට වැඩි ශේෂය රු.1,385,052 ක්ද, වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.1,480,426 ක්ද, වසර 3 ත් 5 ත් අතර ශේෂය රු.70,973,040 ක්ද වී තිබුණි. | ඉදිරියේදී අය කිරීමට කටයුතු සිදුකරන බව. | හිඟ වරිපනම් ආදායම අය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් වටිනාකම රු.80,173,971 කින් රු.16,929,327 ක් අයවීමෙන් අයවීම් ප්‍රතිශතය සියයට 21 ක් වී තිබුණි. | ඉදිරියේදී අය කිරීමට කටයුතු කරන බව. | ප්‍රවර්තන වරිපනම් ආදායම අය කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට්පත්‍රය මගින් නිශ්චය කර ඇති පරිදි, සභාව විසින් ක්‍රියාත්මක කරන ආදාහනාගාර 4 ක් සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අදාළ ගාස්තු ගෙවීමට කමිටු අනුමැතියට ඉදිරිපත් කර ඇති බව. | ගැසට්පත්‍රය අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු එකතුව රු.1,742,000 ක් වටිනා අත්ට්‍රැක්ටරය සහ ජල බවුසරය භාවිතා නොකර පැවතුණි. | අත්ට්‍රැක්ටරය වෙන්දේසි කිරීමටද, ජල බවුසරය ගලි බවුසරයක් ලෙස යොදා ගැනීමටද, කටයුතු කරන බව. | අලුත්වැඩියා කිරීමට හෝ විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.3,500,000 ක් වූ බැකෝ යන්ත්‍රයෙහි අයිතිය පවරාගෙන නොතිබුණි. | අයදුම් පත් අදාළ ආයතනය වෙත භාර දී ඇති බව. | අයිතිය පවරා ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනෙකුගේ ණය අත්තිකාරම් ශේෂය රු.401,591 ක් හිඟ හිටව පැවතුණි. | මරණ පාරිතෝෂිකයෙන් සහ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගන්නා බව. | සේවක ණය අයකර ගත යුතුය. |